*සැ. යු.* - 2024.03.01 දින පළ කරන ලද අංක 2374 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,375 - 2024 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 94 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 96 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මාර්තු මස 28 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. නදීර ලක්මාල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2001.05.23 දින ප්‍රදානය කර ඇති අංක නු/කොත්/උඅණු/01/ප්‍ර/ගො/254 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කැටඹුලාව - උඅණුගල්ඔය අංක 01 හි පදිංචි රත්නායක ලියනගේ සිරිපාල වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ, රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කො/140/988/2004 යටතේ 2004.09.30 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උප ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2024.03.28** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්පනේ කෝරළේ 460 එච් - උඅණුගල්ඔය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොත්මලේ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය මැනුම් අධිකාරි භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක නු. 1339 දරන මූලික පිඹුරේ අංක 216 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.520 (බින්දුවයි දශම පහයි දෙකයි බින්දුවක්) ක් විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - උඅණුගල්ඔය වත්ත

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 215, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 217, |
| *දකුණට* | : කැබලි අංක 218, |
| *බස්නාහිරට* | : කැබලි අංක 224. |

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
තිස්පනේ උප කාර්යාලය

2023 ඔක්තෝබර් මස 28 වැනි දින.

03-140/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. නදීර ලක්මාල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1985.01.28 දින ප්‍රදානය කර ඇති අංක නු/එ/ප්‍ර/1881 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන හෙල්බොඩ පදිංචි ගොඩමුනේ ගෙදර කරුණාවතී වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ, රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කො 3/698/86 යටතේ 1986.06.25 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2024.03.28** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රම්බොඩ පත්තුවේ/කෝරළේ 474D හෙල්සිරිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හෙල්සිරිගම නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, අංක මු. පි. නු. 811 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/239 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.403 විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - හෙල්බොඩවත්ත

| | |
|---|---|
| *උතුරට* | : මු. පි. නු. 811 දරන සැලැස්මේ කට්ටි අංක 229, |
| *නැගෙනහිරට* | : එම - .......... කට්ටි අංක; 66, |
| *දකුණට* | : එම - ........ කට්ටි අංක : 214 2/3 සහ 231, |
| *බස්නාහිරට* | : එම - ......... කට්ටි අංක : 232 |

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කොත්මලේ.

2023 නොවැම්බර් මස 06 වැනි දින.

03-140/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. නදීර ලක්මාල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2002.01.10 දින ප්‍රදානය කර ඇති අංක නු/කොත්/රොත්/ප්‍ර/ගො/528 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පුස්සැල්ලාව රොත්ස්චයිල්ඩ් පදිංචි ගල්ඒදණ්ඩේ ගෙදර ප්‍රේමදාස වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ, රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කො 175/265/2002 යටතේ 2002.03.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උප ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2024.03.28** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේපනේ පත්තුවේ/කෝරළේ 456 ඊ, රජඇළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රජ ඇළ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක කේ/ ආර්එස්/ එස්/ 93-11 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ 12 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - රොත්ස්චයිල්ඩ් වත්ත.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 09, කැබලි අංක 14 සහ කැබලි අංක 13 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 13 සහ මාර්ගය, |
| *දකුණට* | : මාර්ගය, |
| *බස්නාහිරට* | : කැබලි අංක 09, |

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කොත්මලේ.

2023 මැයි මස 30 වැනි දින.

03-140/3

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එස්. පී. ළිදකුඹුර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.03.02 දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර 3539 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන හරස්බැද්ද පදිංචි බලපිටිය ලියනගේ ආරියරත්න ද සිල්වා වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක වල/10/196/87 යටතේ 1987.03.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් සිටි අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.03.28 දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිපළාත පත්තුවේ/526 හරස්බැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හරස්බැද්ද නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක අ. ග. පි. 250 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 371 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 17 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 250 හි කැබලි අංක 370, |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 250 හි කැබලි අංක 372, |
| *දකුණට* | : අ. ග. පි. 250 හි කැබලි අංක 372, |
| *බස්නාහිරට* | : අ. ග. පි. 250 හි කැබලි අංක 374. |

එස්. පී. ළිදකුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2023 ඔක්තෝබර් මස 25 වැනි දින.

03-140/4

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් (අන්තර්) එස්. පී. ළිදකුඹුර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.03.02 දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර 3540 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන හරස්බැද්ද පදිංචි බලපිටිය ලියනගේ ආරියරත්න ද සිල්වා වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක වල/10/195/87 යටතේ 1987.03.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් සිටි අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.03.28** දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිපළාත පත්තුවේ/526 හරස්බැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හරස්බැද්ද නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක අ. ග. පි. 250 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 372 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03 පර්චස් 27 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම

*උතුරට* : අ. ග. පි. 250 හි කැබලි අංක 370, 369 සහ 368,
*නැගෙනහිරට* : අ. ග. පි. 250 හි කැබලි අංක 368,
*දකුණට* : අ. ග. පි. 250 හි කැබලි අංක 374 සහ 373,
*බස්නාහිරට* : අ. ග. පි. 250 හි කැබලි අංක 374 සහ 371

එස්. පී. ළිදකුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2023 ඔක්තෝබර් මස 25 වැනි දින.

03-140/5

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/73126.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* :
එන්සීපී/පීඑල්සී/එල්02/මනුප/04/1

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 304 ගල්කඩවල ග්‍රාම නිලධාරි වසමේ ගල්කඩවල ගමේ ඉඩම් නිලධාරි විසින් අඳින දළ අනුරේඛනයේ කැබලි අංක 01 හි ප්‍රමාණයෙන් අක්කර 05 ක් වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා දඩැල්ලගේ සමන්ති ප්‍රියංගා මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් :

*උතුරට* : මාර්ග රක්ෂිතය හා ඇල රක්ෂිතය,
*නැගෙනහිරට* : ඇල රක්ෂිතය,
*දකුණට* : කේ. එම්. රත්නායක භුක්ති විඳින ඉඩම හා ඇල රක්ෂිතය,
*බටහිරට* : මාර්ග රක්ෂිතය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ) බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.08.09 දින සිට 2053.08.08 දක්වා)

*(ආ) වාර්ෂික බදු මුදල.*- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ

එම තක්සේරුව මත 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ,

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

(ඉ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) බද්ද ක්‍රියාත්මක වන 2023.08.09 දින සිට වසර 05 ක අවම කාලයක් ඉක්මවීමට පෙර අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(එ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*මෙම නිවේදනය* පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 පෙබරවාරි මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-136

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/72970.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* :
එන්සීපී/පීඑල්සී/එල්03/කැකි/4 (III)

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 610, ගනේවල්පොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගනේවල්පොල ගමේ අ. ග. පි. 1174 හි 61 න් කොටසක් පෙන්වීමට අඳින ලද දළ අනුරේඛනයෙහි කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 05, රූඩ් 01, පර්. 27.19 ක් කෘෂිකාර්මික කටයුතු සඳහා අබ්දුල් කපූර් අමීන් මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැකිරාව ගනේවල්පොල ප්‍රධාන මාර්ග රක්ෂිතය A.C.M. අෂ්රොප්ගේ ඉඩම, නිලාබ්දීන්ගේ ඉඩම, දයාවතීගේ ඉඩම් හා කුඩා කන්ද, |
| *නැගෙනහිරට* | : | නිලාබ්දීන්ගේ ඉඩම, දයාවතීගේ ඉඩම් හා කුඩා කන්ද, |
| *දකුණට* | : | රජයේ ඉඩම්, කුඩා කන්ද, ICC ආයතනය භුක්ති විඳින ඉඩම හා ඉල්ලුම්කරුවාගේ වාණිජ ඉඩම, |
| *බටහිරට* | : | කුඩා කන්ද, ICC ආයතනය භුක්ති විඳින ඉඩම, ඉල්ලුම්කරුවාගේ වාණිජ ඉඩම හා කැකිරාව ගනේවල්පොල ප්‍රධාන මාර්ග රක්ෂිතය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.10.10 දින සිට වසර තිහක් ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2023 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බදද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.08.09 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 පෙබරවාරි මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-137

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/56445.
*ඉඩම් කොමසාරිස්ගේ අංකය* : LCD/16/LND/28/02/FI/16

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 56, ලුණුගම්වෙහෙර නව නගරය ග්‍රාම නිලධාරි වසමේ, ලුණුගම්වෙහෙර නව නගරය ගමේ අනුරේඛන අංක දෙබ/සං/02/04/12 හි කැබලි අංක 3726$^{C1}$ න් ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0253 ක් වන රජයේ ඉඩම් කොටස පුණ්‍ය කටයුතු සඳහා ශ්‍රී ලංකා සුමිත්‍රයෝ ආයතනය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය සහ LC/LNG/2016/09/01 A හි කැබලි අංක 3726B, |
| *නැගෙනහිරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය සහ මෙම පිඹුරේ 3726C2, |
| *දකුණට* | : | මෙම පිඹුරේ 3726C2, |
| *බටහිරට* | : | LC/LNG/2016/09/01 A අනුරේඛනයෙහි කැබලි අංක 3726B |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.04.23 දින සිට වසර තිහක් ඉදිරියට)

*(ආ)* *වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම පුණ්‍ය කටයුතු සඳහා

හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.04.27 දින සිට වසර පහක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරුම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*මෙම ගැසට් නිවේදනය* පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 පෙබරවාරි මස 13 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-138

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/73142
පළාත් *ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NCP/PLC/L11/04/ නොච්/දීකා

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 332, තල්ගස්වැව ග්‍රාම නිලධාරි වසමේ ඉහල මාරගහවැව ගමේ ඉඩම් නිලධාරි විසින් අඳින ලද NOC/ LND/CROWN/332/4 දරන දළ අනුරේඛනයේ කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.9554 පමණ වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා දොන් රතිල් නාවාන මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම, |
| *දකුණට* | : | රජයේ ඉඩම, |
| *බටහිරට* | : | අතුරු මාර්ගය හා මාර්ග රක්ෂිතය |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.08.09 දින සිට ඉදිරියට)

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : අය නොකෙරේ.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.08.09 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 පෙබරවාරි මස 08 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.